# බුදු දහමේ ඉගැන්වෙන මානසික ආබාධ පිළිබඳවිමර්ශනයක්

**පනාමුරේ චන්දිම හිමි**

මිනිසා යනු නාම, රූප දෙකේ එකතුවෙන් සකස් වූ සත්ත්වයෙක් බව බුදුදහම පිළිගනියි. රූප යන කොටස සෑම අයෙකුට ම දැකිය හැකිය. පංචස්ඛන්ධය ඒ යටතට ගැනෙයි. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන කොටස් මෙයින් අර්ථවත් කර ඇත. නාම කොටසට ගැනෙන්නේ වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන කොටස් හතරයි. සත්ත්වයා මෙම කොටස් දෙකේ එකතුවෙන් නිර්මාණය වුව ද ශරීරයට දක්වන සැලකිල්ල මනසට නොදක්වයි. මනුෂ්‍ය ශරීරයට සුළු හෝ ආබාධයක් ඇති වූ විට වහාම වෛද්‍යවරයෙකු වෙත ගොස් ප්‍රතිකාර ලබා ගැනීම මිනිසාගේ සාමාන්‍ය සිරිතයි. ඊට අමතරව දිනපතා පිරිසිදු කිරීම්, සුවඳ ගැල්වීම් ආදිය ද සිදු කරයි. ශරීරයේ නිරෝගී බව පිරිසිදු බව වෙනුවෙන් විශාල මුදලක් මෙන්ම කාලය ද කැප කරයි. ඒ සියල්ල සිදු කරනුයේ ශරීරයේ පිරිසිදු බව හා නිරෝගී බව ආරක්ෂා කර ගැනීමටයි. එහෙත් මෙම සැලකිල්ල මනසට නොදක්වයි. මනස රෝගී වූවා යැයි වෛද්‍යවරයෙකු වෙත ගමන් කරන්නේ ඉතාම කලාතුරකිනි. එහෙත් ප්‍රතිකාර නොගන්නේ වුව ද පුද්ගල මනස නිරන්තරයෙන් රෝගාබාධයන් වලට ගොදුරු වෙයි. සූත්‍ර පිටකයේ නොයෙක් සූත්‍රවල මානසික රෝග හෝ ආබාධ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

සත්ත්වයාගේ මනසට වැළඳෙන රෝග පිළිබඳ තොරතුරු ඇතුළත් ඉතාම වැදගත් සූත්‍රයක් වන්නේ මජ්ඣිම නිකායේ වත්ථූපම සූත්‍රයයි. වස්ත්‍රයක් උපමා කරගෙන දේශනා කරන ලද එම සූත්‍රයේදී මනසෙහි ඇතිවන ආබාධ දහසයක් පිළිබඳ තොරතුරු දක්වා ඇත. යම් පුද්ගලයෙක් වස්ත්‍රයකට තමා අභිමත වර්ණයක් එකතු කරන්නේ නම් ඊට ප්‍රථම එම වස්ත්‍රය පිරිසිදු කරගත යුතුය. එවිට එම වස්ත්‍රයට අභිමත වර්ණය එකතු කළ හැකිය. එහෙත් අපිරිසිදු වස්ත්‍රයට එසේ කිසිම වර්ණයක් එකතු කළ නොහැකිය. එසේම ආබාධ වලින් යුක්ත

සිතට කිසිසේත්ම ධර්මය එකතු නොවන බව එම සූත්‍රයේ සඳහන් වෙයි.[1] එසේ ඇති වන රෝගාබාධ ලෙස,

| | | | |
|---|---|---|---|
| 1. | අභිජ්ඣාව | 9. | මායා |
| 2. | ව්‍යාපාද | 10. | සාඨෙය්‍ය |
| 3. | කෝධ | 11. | ථම්භ |
| 4. | උපනාහ | 12. | සාරම්භ |
| 5. | මක්ඛ | 13. | මාන |
| 6. | පළාස | 14. | අතිමාන |
| 7. | ඉච්ඡා | 15. | මද |
| 8. | මච්ඡරිය | 16. | පමාද[2] වශයෙනි. |

මෙම රෝගයන් නිසා මනස අපිරිසිදු වන බව දක්වා ඇත. ක්ලේශ වලින් සිත පිරී පවතින්නේ එවිටය. එම රෝගයන් පිළිබඳ විස්තර දැනගැනීම මානසික රෝගයන් පිළිබඳ බෞද්ධ ආකල්පය අවබෝධ කර ගැනීමට උපකාරී වෙයි. එම රෝගයන් ගෙන් සිත යුක්ත වූ විට මනස අකර්මන්‍ය තත්වයට පත් වෙයි. එකී සිත ධර්මය නොදකියි. ධර්මයට ගරහමින් ධර්මය විවේචනය කරයි. අධර්මය වර්ණනා කරමින් එහි ගුණ වයයි. එකී සිත අපිරිසිදු වස්ත්‍රයක් බඳුය. සිත අපිරිසිදු කරන බලවේග විමසීම මෙහිදී සිදු කළ යුතුය.

**අභිජ්ඣා (අභිධ්‍යාව)**

ලෝභ චේතනාව මුල් වීමෙන් සිදු වන මෙම රෝගයෙහි ස්වභාවය වන්නේ තමා සතු හා අන් අය සතු දේ පිළිබඳ දැඩි ලෙස ආශා කිරීමයි. පෞද්ගලික වශයෙන් තමාට අයත් වස්තූන් පිළිබඳ ආශාවෙන් යුතු වීම ලෝක සම්මතයට විරුද්ධ වූවක් නොවේ. එහෙත් තමාට අයත් නොවන වස්තූන් කෙරෙහි දැඩි ලෙස ආශක්ත වේ නම් එය ලෝක සම්මතයට පවා විරුද්ධය. ඒ ආකාරයට වස්තුව රැස් කිරීම එයට දැඩි ලෙස ආශා කිරීම අභිධ්‍යාවයි. ලෝභ චේතනාව මුල් වී

සිදු වන අකුසලයක් වන මෙය විෂම ලෝභය ලෙස සැලකේ.[3] සිත අපිරිසිදු කරන ක්ලේශ ධර්මයක් ලෙස මෙය හැඳින්විය හැකිය.

**ව්‍යාපාද (ව්‍යාපාදය)**

මෙම රෝගයෙහි ස්වභාවය වන්නේ අන් අයට කරදරයක් වනු දැකීමට කැමති වීමයි. අන්‍යයන්ට අයහපතක් වේවා යන නපුරු (ක්‍රෝධ සහිත) සිතුවිල්ලයි. තමාගේ සද්ධිවිහාරිකයෙකුට (එකට වාසය කරන්නෙකුට) හෝ අසල්වැසියෙකුට අයහපතක් නින්දාවක් අලාභයක් වේවා යන චේතනාව ප්‍රධාන වීම මෙම රෝගයෙහි ස්වරූපයයි. විශේෂයෙන් තමාට අයහපතක් කරාවි යන උපකල්පනයෙන් යුක්තව ඔවුන් සමග ඍජුව ගැටීමට නොහැකි විට මෙම රෝගය බොහෝ විට හටගන්නා බව දැක්වෙයි.[4] දැන් හිතවත්ය. අනාගතයේ දී අහිතවත් වේය යන අදහසින් ද මෙම රෝගය හටගන්නා බව දක්වා ඇත.[5]

**කොධ (ක්‍රෝධය)**

කුරිරු ස්වභාවය මෙම රෝගයෙහි ලක්ෂණයයි. ව්‍යාපාද නම් රෝගයේ දියුණු තත්වයක් මෙමගින් පෙන්නුම් කෙරෙයි. ධර්මයෙහි මෙම රෝගියාගේ ස්වභාවය උගන්වා ඇත්තේ "දණ්ඩෙන් පහර කෑ සර්පයෙකු හා සමාන වෙන බවටයි." ක්‍රෝධය ගින්නක් හා සමාන බව ද දක්වා ඇත. මනසෙහි ඇතිවන කෝපය ශරීරයෙන් ද ප්‍රකට වෙයි. සිතේ කෝපය ඇති වූ විට ශරීරය දාඩිය දමා රත් පැහැ ගන්නේ එබැවිනි. තම පාදය දරුණු ආයුධයක වැදුණ ද කෝපයෙන් එයට ප්‍රතිචාර දක්වන්නට පෙළඹීම මෙම රෝගයේ ස්වභාවයයි.[6]

**උපනාහ (උපනාහය)**

ව්‍යාපාදය නම් රෝගයේ බලවත් ම අවස්ථාව වන්නේ මෙයයි. එනම් දිගින් දිගට ම පවත්නා වූ බද්ධ වෛරයයි. යටපත් වූ ක්‍රෝධය නැවත නැවත ඉස්මතු වීමයි. පරපුරෙන් පරපුරට ගමන් කරන ක්‍රෝධය නිසා විවිධාකාරයේ අපරාධ යුද්ධ ආදිය ඇතිවෙයි. ජනවර්ග අතර පවා යුද්ධ ඇති වන්නේ මෙම ක්‍රෝධය හේතුවෙනි. උපනාහය නම් රෝගය මිනිස් ජීවිතය අඳුරු කරන බලවත් මානසික ව්‍යසනයක් ලෙස පෙන්වාදිය හැකිය.

**මක්ඛ (මක්ඛය)**

බොහෝ මිනිසුන් තුළ දැකිය හැකි බලවත් මානසික රෝග යකි. මෙහි ස්වභාවය වන්නේ අන්‍යයන්ගේ යහපත් ගති මකාදමා කටයුතු කිරීමයි. වඩාත් සරලව පැහැදිලි කරන්නේ නම් තමාට කවුරුන් විසින් හෝ කරන ලද උපකාර සිහිපත් කිරීමට තිබෙන අකමැත්තයි. දරුවන් දෙමව්පියන්ට සැළකිලි සම්මාන නොකර ජීවත් වන්නේ නම් එය "මක්ඛ" නම් මානසික රෝගයේ ස්වභාවයයි. තමාට උපකාර කරන ලද අයෙකු දුටු විට ඔහු මුණ ගැසීමට ඇති අකමැත්ත මෙමගින් පෙන්නුම් කරයි.

**පලාස (පලාසය)**

මෙම මානසික ආබාධයේ ස්වභාවය වන්නේ ගුණවත් උසස් පුද්ගලයන් තමා හා සමාන කොට සැලකීමයි. තමා කිසිදු ගුණයක් නොමැති අසත්පුරුෂයෙකු ලෙස සිටිමින් ගුණවතුන් අතරෙහි ගැවසීමට ගන්නා උත්සාහය මෙමගින් දක්වා ඇත. සෑම ස්ථානයකදී ම තමාට ප්‍රමුඛත්වයක් හිමි විය යුතුය යන සිතුවිල්ල මෙහි දී ක්‍රියාත්මක වෙයි. යුග ග්‍රාහය නමින් හඳුන්වා තිබෙන්නේ ද මෙම තත්ත්වයයි. නූතන සමාජයේ බොහෝ දෙනෙකු තුළ දැකිය හැකි මානසික රෝගී ලක්ෂණ මෙමගින් දක්වා ඇත.

**ඉස්සා (ඊර්ෂ්‍යාව)**

මානසික රෝග අතර ප්‍රධාන තැනක් ගන්නා මෙහි ස්වභාවය වන්නේ අන් අය තුළ ඇති යහපත් ගුණධර්ම පිළිගැනීමට අකමැත්තයි. අන් අයට අයත් වස්තුව පිළිබඳ නොකැමැත්තයි. අන් අයට අයත් වස්තුව පිළිබඳ නොකැමැත්ත මෙහි ස්වභාවයයි. අන්‍යයන්ගේ ධනයට බලයට පමණක් නොව ඇතැම් විට රූපයටද එසේ ඊර්ෂ්‍යා කිරීම මෙම රෝගයෙහි ලක්ෂණයන්ය. අන්‍යයන්ට ඊර්ෂ්‍යා කිරීම නිසා තමාගේ හිතම පිරිහීමට පත්වීම මෙමගින් සිදුවෙයි.

**මච්ඡරිය (මසුරුබව)**

මෙම රෝගයෙහි ස්වභාවය වන්නේ ධනයෙන් හා බලයෙන්

තමා හා සමාන තත්වයට අන්‍යයන් පත්වීමට ඇති අකමැත්තයි. මට මේ තරම් වූ ධනයක් ඇතැයි සිතමින් ක්‍රියා කිරීමයි. ඉතා දැඩි මසුරුකමින් ක්‍රියා කිරීම මෙහි ලක්ෂණයයි. මෙම රෝගය තුළින් ද තම මනස ඉතා ම අපිරිසිදු දුර්වර්ණ රෝගී තත්වයට පත්වෙයි. ධනය එක් රැස්කොට තබා ඒවා භුක්ති නොවිඳ මිය පරලොව යෑම මෙම රෝගයේ ස්වභාවයයි.

**මායා (මායාව)**

බොරුවෙන් අනුන් රැවටීමේ ස්වභාවය මායා නම් රෝග යේ ලක්ෂණයයි. තමාගේ අයහපත් ගති සඟවා ගැනීමට ගන්නා උත්සාහය මෙයින් අර්ථවත් කර ඇත. තමා වරදක් කර ඇති බව පිළිගැනීමට අකමැති සිතක් පහළ වන්නේ මායා නම් රෝගයේ බලයෙනි. පුද්ගලයාට නිවැරදි වීමට තිබෙන අවස්ථාව නැති කරන රෝගයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.

**සාඨෙය්‍ය (සාඨෙය්‍ය)**

සටකපට ස්වභාවයෙන් යුක්ත වීම මෙම රෝගයේ ප්‍රධාන ලක්ෂණයයි. කුමන හෝ ආකාරයෙන් අන්‍යයන් රැවටිය යුතුය යනුවෙන් ඇතිවන රෝගයකි. තමාගේ මිතුරන් හෝ සද්ධිවිහාරිකයන් මුලාවට පත්වන අයුරින් ක්‍රියා කිරීම මගින් මෙම රෝගය බලාත්මක වෙයි. එයද මනස දුර්වර්ණ කරන ලක්ෂණයකි.

**ථම්භ (ස්ථම්භ)**

සිතෙහි පවත්නා තදගතිය මෙමගින් අර්ථවත් කර ඇත. සුඛනම්‍ය බවින් තොරවීම මෙහි ස්වභාවයයි. එවැන්නන්ගේ සිත කණුවක් හා සමාන යැයි දක්වා ඇත. ස්ථම්භය කිසිවෙකුට එක් දිශාවකට හෝ නොනැමිය හැකි සේ මෙම රෝගයෙන් යුක්ත තැනැත්තා කිසිවෙකුටත් නොනැමෙයි. දෙමාපියන්ට වැඩිහිටියන්ට ගුරුවරුන්ට හෝ බුද්ධිමතුන්ට කිසි දිනෙක අවනත නොවීම මෙහි ස්වභාවයයි.

**සාරම්භ (සාරම්භය)**

අන්‍යයන් අතර කැපී පෙනෙන ආකාරයෙන් ක්‍රියා කිරීම මෙහි ලක්ෂණයයි. අනුන් පරයා කටයුතු කිරිමට ඇති නොතිත් ආශාව මෙමගින් පෙන්නුම් කෙරෙයි. හොඳ නරක වශයෙන් මෙන්ම භෞතික වශයෙන් ද අනුන් පරයා කටයුතු කිරීමට වෙහෙසීමයි.

**මාන (මානය)**

මනුෂ්‍ය චිත්තාභ්‍යන්තරයෙහි හටගන්නා ඉතා බලවත් රෝග යක් වන මෙහි ස්වභාවය වන්නේ නොයෙක් ආකාරයෙන් අන්‍යයන් හා සංසන්දනය කිරිමට යොමු වීමයි. යහපත් දේ මෙන්ම අයහපත් දේ පිළිබඳ ව මැන බලමින් කටයුතු කිරීම මෙහි ලක්ෂණයයි.

**අතිමාන (අතිමානය)**

ඉහතින් දැක් වූ රෝගයේ ම වර්ධනීය අවස්ථාවක් මෙම රෝග යෙන් පෙන්නුම් කෙරේ. අන් අය පහත් කොට සලකා ක්‍රියා කිරීම මෙහි ලක්ෂණයයි. තමාගේ යොවුන් බව තිලය, බලය, කුලය, පන්තිය ආදිය නිසා ද මෙම රෝගය ඇති විය හැකිය.

**මද (මදය)**

මදය යනුවෙන් හඳුන්වා තිබෙන්නේ ද මත්වීමයි. ජාති, ගෝත්‍ර, කුල ආරෝග්‍ය ආදී දේවලින් මම සියල්ලන්ටම වඩා උසස් බව ප්‍රාර්ථනා කිරීම මෙම රෝගයේ ස්වභාවයයි.

**පමාද (ප්‍රමාදය)**

කුසල ධර්මයෙහි ප්‍රමාදය මෙමගින් පෙන්නුම් කර ඇත. සිතින් සිතා කටයුතු නොකර ඕනෑ ම දෙයක් සිදුවීමට ඉඩහැර බලා සිටීම මෙහි ස්වභාවයයි. අලස බව ගම්‍යමාන කර තිබෙන අයුරු පෙන්වාදිය හැකිය. මෙම රෝගයන් නිසා මනස දුර්වර්ණ වී අපිරිසිදු මනසක් ඇතිවීම මෙම රෝගයන් තුළින් සිදුවෙයි. පිරිසිදු මනසක් ඇති වීමට නම් මෙම රෝග මානසිකත්වය ඉවත් කර සිත පිරිසිදු කර ගත යුතුය. මෙම මානසික රෝග ලක්ෂණ දහසය වත්ථූපම සූත්‍රය තුළ

මැනවින් විස්තර කර ඇත. එසේම මානසික රෝග පිළිබඳ ඉතා ම සංකීර්ණ විස්තරයක් මජ්ඣිමනිකායේ සල්ලේඛ සූත්‍රයේ අන්තර්ගත වෙයි. එය සල්ලේඛ පරියාය යන නාමයෙන් හඳුන්වනු ලැබේ. සිතට ඇති වන රෝග සිව්සාලිසක් ඉවත් කිරීමෙන් සිත පිරිසිදු වන අයුරු එහිදී පෙන්වා දෙයි. බුදුරජාණන් වහන්සේ විසින් චුන්ද තෙරුන්ට දේශනා කරන ලද එම මානසික ස්වභාවයන් වන්නේ,

1. අන්‍යයෝ අනුනට හිංසා කරති යන සිතුවිල්ල මානසික රෝගයකි.
2. ප්‍රාණඝාතය කරමියි සිතීමෙන් මානසික රෝගයක් වැළඳේ.
3. සොරකම් කරමියි සිතීමෙන් මනස අපිරිසිදු වේ.
4. වැරදි ලෙස කාමයෙහි හැසිරෙමියි සිතීමෙන් සිත අපිරිසිදු වේ.
5. මුසා බස් කීමට සිත යෙදවීම නිසා මානසික රෝග ඇති වේ.
6. කේලාම් කීමෙන් ද සිත රෝගයන්ගෙන් යුතු වෙයි.
7. දැඩි ආශාවෙන් යුක්ත වීමෙන් මානසික රෝග වැළඳේ.
8. දැඩි ක්‍රෝධයෙන් යුක්ත වීමෙන් මානසික රෝග වැළඳේ.
9. නිවැරදි දැකීමෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.
10. නිවැරදි කල්පනාවෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.
11. නිවැරදි වචනයෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.
12. නිවැරදි කර්මාන්තයෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.

13. නිවැරදි ආජීවයෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.

14. නිවැරදි උත්සාහයෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.

15. නිවැරදි සිහියෙන් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.

16. සිතෙහි එකඟ බවින් තොර වීමෙන් මානසික රෝග වැළඳේ.

17 නිවැරදි නුවණ නොමැති වීමෙන් මානසික රෝග වැළඳේ.

18 නිවැරදි විමුක්තිය නොමැති වීමෙන් මානසික රෝග වැළඳේ.

19. ථීනමිද්ධය ඇති වීමෙන් මානසික රෝග වැළඳේ.

20 උද්ධච්චය ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

21. සැකය ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

22 ක්‍රෝධය ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

23 බද්ධ වෛරය ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

24. ගුණමකු බව ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

25. යුග ග්‍රාහයෙන් යුක්ත වීමෙන් මානසික රෝග වැළඳේ.

26. ඊර්ෂ්‍යාවෙන් ද මානසික රෝග වැළඳේ.

27. මසුරු බවින් ද මානසික රෝග වැළඳේ.

28. කපටි බවින් ද මානසික රෝග වැළඳේ.

29. අනුන් රවටන ස්වභාවයෙන් යුක්ත වීමෙන් ද මානසික රෝග වැළඳේ.

30. තද ගතියෙන් යුක්ත වීමෙන් ද මානසික රෝග වැළඳේ.

31. අධික මානයෙන් යුක්ත වීමෙන් ද මානසික රෝග වැළඳේ.

32. සුවච බවින් තොර වීමෙන් ද මානසික රෝග වැළඳේ.

33 කල්‍යාණ මිතුරන් නොමැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

34. ප්‍රමාද බවින් යුක්ත වීමෙන් ද මානසික රෝග වැළඳේ.

35 ශ්‍රද්ධාව නැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

36 ලජ්ජා බව නැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

37 පවට බිය නො වීමෙන් ද මානසික රෝග වැළඳේ.

38 බහුශ්‍රැත ආශ්‍රය නැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

39 ආරබ්ධ වීර්යය නැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

40 එළඹ සිටි සිහිය නැති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

41. ප්‍රඥාවෙන් තොර වීමෙන් ද මානසික රෝග වැළඳේ.

42. වැරදි දෘෂ්ටි ඇති වීමෙන් ද මානසික රෝග වැළඳේ.

මෙම ලක්ෂණවලින් යුක්ත වූ පුද්ගලයාගේ මනස දුර්වර්ණ වූ රෝග සහිත මනසක් බව සල්ලේඛ සූත්‍රයෙන් අවබෝධ කරගත හැකිය. මෙහි වැදගත්ක ම මැනවින් ගම්‍ය වන්නේ මානසික රෝග යන්ට මූල හේතු වූ කරුණු මෙහි අන්තර්ගත වන බැවිනි.

මනසට වැළඳෙන රෝගාබාධයන්ගෙන් විවිධ ස්වරූපයන්ගෙන් ක්‍රියාත්මක වෙයි. ඒවා කායිකව දැකිය හැකිය. මානසික රෝගවලින් මනස යුක්ත වන්නේ ද යන්න අවබෝධ කර ගැනීම අපහසුය. ඇතැමෙක් මාගේ මනස ඉතාමත් නිරෝගීමත්ය යන සංකල්පනාවෙන් යුක්ත වෙති. එහෙත් මෙය ඍජුව ම ප්‍රකාශ කළ නොහැක්කකි. එයට හේතුව වන්නේ ඇතැම් කෙලෙස් මනසේ

සැඟවී පවතින හෙයිනි. එබඳු කෙලෙස් සහිත හා රහිත පුද්ගලයන් සිව් දෙනෙකු පිළිබඳ මජ්ඣිම නිකායේ අණංගණ සූත්‍රයේ ඇතුළත් වී ඇත.[7] අඞගණ යනු වෙන් උගන්වා තිබෙන්නේ සිත දූෂණය කරන කෙලෙස්ය. එවැනි කෙලෙස් සඟවාගෙන කෙලෙස් නැත්තන් ලෙස පෙනී සිටීම පුහුදුන් මානසික ස්වභාවයකි. එකී පුද්ගලයන් වන්නේ,

1. කෙලෙස් සහිතව වෙසෙමින් මා තුළ කෙලෙස් ඇතැයි තතු සේ නොදන්නා තැනැත්තාය.

2. කෙලෙස් සහිතව වෙසෙමින් මා තුළ කෙලෙස් ඇතැයි තතු සේ දන්නා තැනැත්තාය.

3. කෙලෙස් රහිතව වෙසෙමින් මා තුළ කෙලෙස් නැතැයි තතු සේ නොදන්නා තැනැත්තාය.

4. කෙලෙස් රහිතව වෙසෙමින් මා තුළ කෙලෙස් නැතැයි තතු සේ දන්නා තැනැත්තාය වශයෙනි.

මේ අතරින් කෙලෙස් ඇති දෙදෙනා අතරින් යමෙක් තමා තුළ කෙලෙස් තිබෙන බව නොදන්නේ නම් ඔහු හීන තැනැත්තෙකු යැයි ද කෙලෙස් සහිතව වෙසෙමින් තමන් තුළ කෙලෙස් තිබෙන බව දන්නා තැනැත්තා ශ්‍රේෂ්ඨ තැනැත්තා යයි ද, කෙලෙස් රහිත දෙදෙනා අතරින් තමන් තුළ කෙලෙස් රහිත බව නොදන්නා තැනැත්තා හීන තැනැත්තා යයි ද, කෙලෙස් රහිතව වෙසෙමින් තමන් තුළ කෙලෙස් රහිත බව දන්නා තැනැත්තා ශ්‍රේෂ්ඨ තැනැත්තා යයි ද පැවසෙයි. මේ අනුව ශ්‍රේෂ්ඨ තැනැත්තා කවරෙක් ද යන්න අවබෝධ කරගත හැකිය. අඞගණ යනුවෙන් මෙම සූත්‍රය නම් කර තිබෙන්නේ කෙලෙස් රහිතය යන අදහසිනි.

මානසික රෝගයන් පිළිබඳ තොරතුරු අන්තර්ගත සූත්‍රයකි, මජ්ඣිම නිකායේ පියජාතික සූත්‍රය. එහි අන්තර්ගත වී ඇත්තේ පංච ඉන්ද්‍රියයන් තුළින් ග්‍රහණය කරගන්නා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන සියල්ල හේතුවෙන් මානසික රෝගයන් ඇතිවන බවයි. මෙහිදී විශේෂයෙන් දුක්ඛ සංකල්පය යටතේ විග්‍රහ කරන ලද කරුණු (ඉපදීම, වයසට යෑම ආදී) මානසික රෝගයන් බවයි. ඒවා නොසලකන

පුද්ගලයා අඥානයෙකු බව දේශනා කොට ඇත. පියජාතික සූත්‍රයේ අන්තර්ගත අදහස සැකෙවින් විමසුවහොත් සංස්කාරයන් ග්‍රහණය කර ගැනීම මානසික රෝගයන් නිසා සිදුවන්නකි.[8]

වර්තමාන සමාජයේ මිනිසුන් තුළ දැකිය හැකි විවිධාකාර මානසික රෝග ලක්ෂණ බුදුදහමේ විවිධ සූත්‍රයන් තුළ අන්තර්ගත වී ඇති ආකාරය ඉහත සඳහන් කරුණුවලින් මනාව අවබෝධ කරගත හැකිය. මානසික රෝග යනු බටහිර මනෝවිද්‍යාඥයින් අප උගන්වන යමක් නොව ථෙරවාද බෞද්ධ දර්ශනය තුළ මැනවින් විග්‍රහ වන සංකල්පයක් බව පෙන්වාදිය හැකිය. මානසික රෝග බුදුදහමේ උගන්වා ඇති ආකාරය ඉහත කරුණු අනුව මනාව අවබෝධ කරගත හැකිය.

**ආන්තික සටහන්**

1. *මජ්ඣිමනිකාය I*, මූලපරියාය වග්ගය, වත්ථූපම සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 86 පිටුව.
2. එම. 87 පිටුව.
3. එම.
4. එම. 88 පිටුව.
5. එම.
6. එම. 90 පිටුව.
7. *මජ්ඣිමනිකාය I*. මූලපරියාය වග්ගය, අනංගණ සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 56 පිටුව.
8. *මජ්ඣිමනිකාය I*. රාජ වග්ගය, පියජාතික සූත්‍රය, ත්‍රි. බු.ජ.මු. 86 පිටුව.